# <u>මොනරාගල ප්‍රාදේශීය සභාව</u>
# <u>2021.10.15 දින මහ සභා වාර්තාව</u>

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් තුන්වන (43) සභා වාරය 2021.10.15 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**<u>පැමිණීම</u>**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. එසේම සියලුම සභිකවරුන්ට දුරකථනයෙන් දැනුම් දී සාකච්ඡා කර ගත් පරිදි ඔබ සියලුදෙනාගේම කැමැත්ත මත අද දිනට මෙම මස සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 01. <u>පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම</u>.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**නැත**

## 03. <u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

**ඉදිරිපත් වී නොමැත**

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

**නැත**

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

### 05.01 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

සභාව සතු වැලියාය පුස්තකාල ගොඩනැගිල්ලේ සහ ඉදිකොට ඇති නව පුවත්පත් අංශයේ පාඨක අවශ්‍යතා නිසි පරිදි පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- පුස්තකාලයෙහි වහලය එක් පැත්තකින් පහත් වී ඇති අතර සිවිලිමෙහි ෂීට් දෙකක් ගැලවී ජලය පුස්තකාල අභ්‍යන්තරයට කාන්දු වන බැවින් එම තත්ත්වය පිළිසකර කිරීම.
- පුස්තකාල ගොඩනැගිල්ලේ පේව්මන්ට් එක සහ ඒ වටා අබලන්ව ඇති කාණුව පිළිසකර කිරීම.
- පුස්තකාල ගොඩනැගිල්ලේ අබලන්ව ඇති ජනෙල් පද්ධතිය සහ ඉදිරිපස දොර පිළිසකර කිරීම.
- පුස්තකාල ගොඩනැගිල්ලට සහ නව පුවත්පත් අංශයට නව සිවිලිම් විදුලි පංකා 3ක් සවි කිරිම
- පුස්තකාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර බිම පුපුරා ගොස් ඇති බැවින් එම තත්ත්වයන් පිළිසකර කිරීම.

- ඉදිකොට ඇති නව පුවත්පත් අංශය සඳහා සිවිලිමක් සවි කිරීමත් වහලයට වැටෙන ජලය බැස යාමට අවශ්‍ය දම් වැල් සවිකිරීම සහ එම අංශයට අවශ්‍ය කරන තිර රෙදි සවි කර දීම

- පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ට අත් සේදීම සඳහා සින්ක් එකක් සවි කරදීම

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් ධම්මික විතානගේ ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාවේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම පුස්තකාලයේ අදාළ අළුත්වැඩියා කටයුතු සහ පවතින මෙම අඩු පාඩු සම්බන්ධයෙන් නිර්දේශ වාර්තාවක් ලබා ගෙන විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදල් මගින් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල, ඩිපෝව පාර, මයුරපුර සමිති ශාලාව පසු කර මීටර් 25 ක් පමණ ඩිපෝව දෙසට යන විට චමිලා මහත්මියගේ නිවස අසලින් වමට ඇති මීටර් 110 ක් පමණ වන පස් පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර දෙන ලෙස එම පාරේ පදිංචිකරුවන් විසින් කර ඇති ඉල්ලීම සඳහා සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම මාර්ග කොටස පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා ඇමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**05.02 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චාමර නානායක්කාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

මොනරාගල, හිදිකිවුල, රත්මල් මාවත පිහිටි සමිති ශාලාව සහා අරමුදලින් ප්‍රතිසංස්කරණය කිරිම සඳහා (ඇස්තමේන්තු මුදල රු.500,000.00) සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී චාමර නානායක්කාර මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**05.03 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

ග්‍රාමසේවා වසම් 03 කින් සමන්විත බටුගම්මන කොට්ඨාසයේ සංවර්ධනය කළ යුතු බොහෝ කෘෂි මාර්ග හා අතුරු මාර්ග අතුරින් පහත සඳහන් මාර්ග සභා අරමුදලින් සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී පී.බණ්ඩාර මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- දික්තලාව අතුරු මාර්ගය(වෙල පාර)
- බටුගම්මන දුනුගේආර මාර්ගය(මීටර් 15)

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.04 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොනරාගල, කුඹුක්කන ග්‍රාම නිලධාරි වසමේ සිල්බර පාර අතුරු මාර්ගයේ පවුල් 10 ක පමණ පිරිසක් ආරකින් එගොඩ වීමට මෙතෙක් භාවිතා කර ඇත්තේ ඒ දණ්ඩක් වන අතර, මෙය සකස් කර ගැනීම සඳහා ඔවුන්ගේ පුද්ගලික වියදමින් ලයිට් කණු 06 ක් ගෙනවිත් ඇති බැවින්, මේ සඳහා සභා අරමුදලින් පැති බැමි 02 ක් සකස් කර කණු අතුරා එම ස්ථානය සකස් කර දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.05 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොනරාගල, මුප්පනේ ග්‍රාම සේවා වසමේ අක්කර 25 මෙත්සිත් මාවත මීටර් 50 ක් පමණ සභා අරමුදලින් සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රි රංජිත් රත්නායක මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල, බිබිල පාර නව කච්චේරිය අසල ඇති මොනරාගල ප්‍රාදේශීය සභාව සතු උද්‍යානයේ ඇවිදින මංතීරුවල කුට්ටි ගල් අල්ලා සභා අරමුදලින් සංවර්ධනය කර දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී රංජිත් රත්නායක මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර එහිදී මේ වන විට දරුවන් මෙන්ම, රජයේ සේවකයින්, උසස් නිලධාරීන් ඇතුළුව බොහෝ දෙනෙකු ශරීර සුවතා සඳහා මෙම ස්ථානයට පැමිණෙන බැවින් මෙම ස්ථානයේ විනිවිද භාවයක් තිබිය යුතු අතර විශේෂයෙන්ම මෙහි අවිදින මං තීරු , ආලෝකය වැඩි විදුලි බුබුලු සවි කිරීම, ඉදිරිපස වැට සකස් කිරීම මෙන්ම අනෙකුත් අත්‍යාවශ්‍ය පහසුකම් ද සලසා දිය යුතු බවට සභාවේ සාකච්ඡාවට බඳුන් විය.
ඉන් අනතුරුව මෙම කටයුතු සියල්ලම සිදු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් සභාවෙන් විමසීම් කර සිටින ලදී. එහිදී මේ සඳහා විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඇවිදින මංතීරුවල කුට්ටිගල් අතුරා සකස් කර අනෙකුත් සංවර්ධන කටයුතු ද හැකි අයුරින් සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.06 ප්‍රාදේශීය සභා ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල කහඹාන ග්‍රාම සේවා වසමේ කලුගම්මමුල්ල රදාන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එය සභා අරමුදලින් පිළිසකර කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.07 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.උපුල් මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල හුලංදාව දකුණ ග්‍රාම සේවා වසමේ හුලංදාව දකුණ තිස්සපුර ගුණපාල මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සභා අරමුදලින් පිළිසකර කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී වයි.උපුල් මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.08 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල වෙහෙරගල ග්‍රාම සේවා වසමේ පාසල අසල බෝක්කුව සභා අරමුදලින් ඉදිකර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**05.09 ප්‍රාදේශීය සභා ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

2022 වර්ෂයේ අය වැය සඳහා නව ආදායම් හා පවතින ආදායම් තත්ත්වය වැඩි කර ගැනීම සඳහා ඉදිරිපත් වූ පහත සඳහන් යෝජනා සඳහා සභා අනුමැතිය හා සභා තීරණය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- මාර්ග තලනයෙන් ප්‍රමාද ගාස්තු අය කිරිම, ප්‍රමාද වන එක් දිනක් සඳහා රු.100-500 දක්වා
- ජේ.සී.බී.යන්ත්‍රයේ පැයකට අය කරන ගාස්තුව රු.500-750 දක්වා වැඩි කිරිම් සම්බන්ධව
- මෝටර් ගේඩරය සඳහා කුළිය රු.රු.500-700 දක්වා වැඩි කිරිම
- ආදාහනාගාර ගාස්තු බල ප්‍රදේශය තුළ රු.8500.00 සහ බල ප්‍රදේශයෙන් පිටත රු.9500.00 දක්වා ඉහළ දැමීම
- පැළ තවානක් ආරම්භ කිරිම සම්බන්ධව
- වාහන සෝදා පවිත්‍ර කිරිමේ ස්ථානයක් සකස් කිරිම සම්බන්ධව
- කඩදාසි බෑග් නිර්මාණය කර අලෙවි කිරිම සම්බන්ධව

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී පිටස්තර යන්ත්‍ර සූත්‍ර වලින් අපට වැඩිය මුදල් අය කරන බැවින් අපගේ අය කිරීම්ද යම් මුදලකින් වැඩි කරමු බවත්, කෙසේ වෙතත් ලබන වර්ෂයේ ආදායම් උත්පාදනය කිරීමේ වැඩ පිළිවෙලවල් ආරම්භ කිරීමට සිදුවන බවත් , ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

එහිදී සභාවේ සාකච්ඡා වූ පරිදි

- මාර්ග තලනයේ මේ වන විට පැයකට අය කරන ගාස්තුව වන රු.4000.00 ක මුදල රු.4750.00 දක්වා වැඩිකිරීම සුදුසු බවත්, මෙහි ප්‍රමාද ගාස්තු අය කිරිම ප්‍රමාද වන සෑම එක් දිනක් සඳහාම රු. 500.00 ක මුදලක් අය කිරීම සුදුසු වන අතර මෙහිදී වැඩ කිරිම සඳහා නිශ්චිතව ම ගැනුම්කරු විසින් සඳහන් කර මුදල් ගෙවන බවට තීරණය කර ඇති අවස්ථාවලදී එම දින ගණන ඉක්මවා අමතර සතියක කාලයක් තවදුරටත් ප්‍රමාද ගාස්තු අය කිරිමක් සිදු නොකිරීමටත් ඊට වඩා ප්‍රමාද වන සෑම සෑම දිනක් සඳහා ම දිනකට රු.500/= බැගින් ප්‍රමාද ගාස්තුවක් අය කිරිමටත් තීරණය විය.

- ජේ.සී.බී.යන්ත්‍රයේ මේ වන විට පැයකට අය කරන ගාස්තුව වන රු.2750.00 මුදල රු.3000.00 දක්වා වැඩිකිරීම සුදුසු බවත්,

- මෝටර් ගේඩරය සඳහා මේ වන විට පැයකට අය කරන ගාස්තුව වන රු.3500.00 මුදල රු.4000.00 දක්වා වැඩිකිරීම සුදුසු බවත්, මේ සඳහා පැය 01 ක කාලයකට ලබා ගන්නා ඉන්ධන ලීටර් 10 ක ප්‍රමාණය ඒ ආකාරයට ම ලබා ගැනීමට කටයුතු කිරිම සුදුසු බවත්, සභාව ඒකමතිකව තීරණය කළ අතර මෙම මුදල් වැඩිකිරීම විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ගැසට් කර ඒ අනුව අය කිරීමට පියවර ගැනීම සුදුසු බවට සභාව තීරණය කර සිටින ලදි.

එසේම සභාවේම සේවකයින් යොදවා ලබන වර්ෂය තුළ ආදායම් උත්පාදනය කිරීමේ වැඩකටයුතු සකස් කිරීමේදී සභාව මගින් තෝරා ගත් සුදුසු ස්ථානයන්වල පැළ තවානක් ආරම්භ කිරිම සම්බන්ධවත් වාහන සෝදා පවිත්‍ර කිරිමේ ස්ථානයක් ආරම්භ කිරිම සම්බන්ධවත් කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කර අනුමත කරන ලදී. එසේම රටේ පවතින තත්ත්වයත් සමඟ ආදාහනාගාර ගාස්තු ඉහළ දැමීම සුදුසු නොවන බවත්,නමුත් ලබන වර්ෂයේ ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහනක් වශයෙන් ආදාහනාගාරයේද තාප්පවල කබඩ් ගසා මිණී අලු තැන්පත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු බවටත්, කඩදාසි බෑග් නිර්මාණය කර අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරිම පසුවට කල් තබමු බවටත් සභාව ඒකමතිකව තීරණය කර සිටින ලදි.

**යෝජනා අංක 02**

මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මොණරකැලේවත්ත ලක්ෂ්මී පෙර පාසලේ ළමුන් 30 දෙනෙකු පමණ අධ්‍යාපනය ලබන අතර, එහි පහත සඳහන් අඩුපාඩු සකස් කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- අබලන් වී ඇති වහලය ප්‍රතිසංස්කරණය කිරිම
- පානීය ජල පහසුකම් සපයා දීම
- වැසිකිළියක් සකස් කර දීම
- වැටක් සකස් කර දීම

එම යෝජනාව සුදුසු බවට තමොදිරම් ජයශීලන් ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙම පෙර පාසලේ අදාල අඩු පාඩු සභා අරමුදල් යටතේ සකස් කර දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා සිදු කිරිම හා වාර සේවා සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | PF 7419 | ටයර් 04 ක් මිලදී ගැනීම | 132560.00 |
| 02 | PF 7419 | බ්‍රේක් පෑඩ් දැමීම හා වාර සේවා සිදු කිරිම | 42284.00 |
| 03 | 252-6330 | ඕල්ටනේටරය අළුතින් දැමීම | 25000.00 |
| 04 | 252-6330 | ජොයින්ට් කුරුස අළුතින් දැමීම හා සේවා ගාස්තු | 142911.00 |
| 05 | 252-6330 | පවර් ස්ටීරියන් හෝස් එක දැමීම හා ඔයිල් දැමීම | 3750.00 |
| 06 | 252-6330 | ඕල්ටනේටරය සවි කර වයර් කිරිම | 3800.00 |
| 07 | 252-6330 | වාර සේවා සිදු කිරිම | 21160.00 |
| 08 | RS -1800 | වාර සේවා සිදු කිරිම | 23840.00 |
| 09 | RS -1800 | ටයර් පැච් දැමීම | 4680.00 |
| 10 | ZA 5061 | බැකෝ ලෝඩරයේ ඩීසල් හෝස් එකක් අළුතින් දැමීම | 3000.00 |
| 11 | ZA 5061 | සයිලන්සර් අළුත්වැඩියා කිරිම | 3600.00 |
| 12 | ZA 5061 | හෝස් එක සවි කිරිම | 3450.00 |
| 13 | ZA 5061 | ග්‍රිස් නිපල්, ග්‍රිස් ගන් මිලදී ගැනීම | 9155.00 |
| 14 | ZA 5061 | ස්විමින් ජැක් එකෙහි අළුත්වැඩියාව සඳහා ඔයිල් මිලදී ගැනීම | 12237.70 |
| 15 | ZA 5061 | ඕල්ටනේටරය ගලවා අළුත්වැඩියා කිරිම | 4800.00 |
| 16 | LL 6980 | ඩ්‍රම් ට්‍රක් රථයේ ක්ලච් රේසර් සෙට් එක මිලදී ගැනීම | 8500.00 |
| 17 | LL 6980 | ක්ලච් රේසර් එක සවි කිරිමේ ගාස්තු | 4950.00 |
| 18 | LL 6980 | වාර සේවා සිදු කිරිම | 37210.00 |
| 19 | GC5148 | ගිනි නිවන රථය වාර සේවා සිදු කිරිම | 13280..00 |
| 20 | RC 1112 | බැටරියක් මිලදී ගැනීම | 23400.00 |
| 21 | 49-5301 | හයිඩ්‍රොලික් පද්ධතිය අළුත්වැඩියා කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම | 47430.00 |
| 22 | 49-5301 | හයිඩ්‍රොලික් පද්ධතිය අළුත්වැඩියා කටයුතු සඳහා වැඩ කුළිය | 22000.00 |
| 23 | 49-5301 | වාර සේවා සිදු කිරිම | 16390.00 |
| 24 | 49-5301 | හෙඩ් ලයිට් බල්බ හා ඩීසල් කැප් මිලදී ගැනීම | 4050.00 |

මෙම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

එහිදී මෙහි අනු අංක 04 යටතේ ඇති 252-6330 කැබ් රථයේ ජොයින්ට් කුරුස අළුතින් දැමීම හා සේවා ගාස්තුව වශයෙන් වැරදියට සටහන් වී ඇති රු.142911.00 ක මුදල රු.5600.00 ක් ලෙසට නිවරදි විය යුතු බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී ආයතනයේ බැකෝලෝඩර් යන්ත්‍රය නිතරම ක්‍රියාවිරහිත වන අතර සැහෙන මුදලක් ගෙවා නිතරම අලුත්වැඩියා කිරීමට සිදුවන බවත්, මේ වන විට රක්ෂණ සමාගම් මගින්ද ගෙවනු ලබන්නේ අඩු මුදලක් වන අතර ඉතිරි මුදල් සභාවෙන් ගෙවීම් කිරීමට සිදුවන බවත්, මෙහි සේවාවන්ද නිතරම අත්‍යාවශ්‍ය වන නිසාත් නව බැකෝලෝඩර් යන්ත්‍රයක් ණයක් ලබා ගෙන මිල දී ගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙහි අනු අංක 04 හි සංශෝදනයත් සමඟ නිසි ක්‍රම වේදයන්ට යටත්ව හා අදාල පරීක්ෂණ වාර්තා, නිර්දේශ කිරීම් හා අදාල අනුමැතීන්ට යටත්ව මෙම අලුත්වැඩියා කටයුතු සිදු කර මෙම ගෙවීම් කටයුතු සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවටත්, ඒ වගේම රක්ෂණ සමාගම් මගින් අදාල වාහන සඳහා අඩුවෙන් මුදල් ගෙවනු ලබන අවස්ථාවන්වලදී ඊට අදාල ඉතිරි මුදල් සභා අරමුදලින් ගෙවීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 04**

වැලියාය සායන මධ්‍යස්ථානයේ ඉදිරිපිට තහඩු යොදා තාවකාලිකව ඉදිකර ඇති ගොඩනැගිල්ලේ සම්පූර්ණ දිග ආවරණය වන පරිදි දීර්ඝ කර එහි බිම කොන්ක්‍රීට් කර දෙන ලෙස මොනරාගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තිලිණ වෙල්ලාලගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් ධම්මික විතානගේ මහතා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සභා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා මොනරාගල ප්‍රාදේශිය සභාවට ට්‍රැක්ටර් හා ටේලර් අළුත්වැඩියා කිරිම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත අංක සඳහන් ට්‍රැක්ටර් රථ අළුත්වැඩියා කිරිම සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

- 49-5301 ට්‍රැක්ටර් රථය
- UP RD 4488 ට්‍රැක්ටර් රථය
- UP RC 1112 ට්‍රැක්ටර් රථය

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ට්‍රැක්ටර් රථ පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල අලුත්වැඩියා කටයුතු අදාල ප්‍රතිපාදන යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 06**

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 ව්‍යාපෘතියට අනුව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති පහත සඳහන් මාර්ග කොන්ක්‍රීට් කිරිම සඳහා රු.මි.04 ක ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් එම මාර්ග සංවර්ධනය කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | කර්මාන්තයේ නම | වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|
| 01 | දෙබැද්දේකිවුල ග්‍රාම නිලධාරි වසමේ දික්තලාව අතුරු මාර්ගය (ජේ.එම්.රත්නායක මහතාගේ නිවස දක්වා) | 1,000,000.00 |
| 02 | දෙබැද්දේකිවුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගඟ අසල මාර්ගය | 1,000,000.00 |
| 03 | කුඹුක්කන ග්‍රාම නිලධාරි වසමේ 14 කණුව කුඹුක්කන සෝමදාස මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය | 1,000,000.00 |
| 04 | කුඹුක්කන ග්‍රාම නිලධාරි වසමේ 14 කණුව පන්සල පාර සුනිල් මහතාගේ නිවස අසල මාර්ගය | 1,000,000.00 |

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කර්මාන්තයන් අදාළ ප්‍රතිපාදන යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

පසුගිය 2020.12.11 දින මහ සභා අනුමැතියට ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කිරීමෙන් අනතුරුව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමන් විසින් මෙය පසුගිය වර්ෂයේ අනුමත යෝජනාවක් බැවින්, මෙම වර්ෂයේ නැවත මහ සභා යෝජනා ස්ථිරත්වයකින් එවන ලෙසට අප වෙත දැනුම් දී ඇත. ඒ අනුව මොනරාගල, වැදිකුඹුර, බෝහිටිය හි පදිංචි ඩී.ජී.විජය මහතා විසින් ඔහු මේ වන විට ආබාධිත තත්ත්වයේ පසුවන බැවින් සාමාන්‍ය වැසිකිළියක් භාවිතා කිරීමට නොහැකි බවත්, ඔහු සඳහා සභා අරමුදලින් කොමඩ් වැසිකිළියක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටීමේදී පහත සඳහන් පරිදි මේ සඳහා සභා තීරණ ගන්නා ලදි.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම අවශ්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල ආබාධිත පුද්ගලයාට කොමඩ් වැසිකිළියක් සහා අරමුදල් යටතේ ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යොමු කර ඊට අදාල ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

මොනරාගල, පොතුවිල් පාර, අංක 210 හි පදිංචි ආර්.එම්.ඒ.එස්.දිසානායක මහතා විසින් ඔහු ව්‍යාපාර කටයුතු කරගෙන යන අතුරු මාර්ගය සඳහා මේ වන විට නමක් නොමැති බැවින්, එම මාර්ගය සඳහා “දිසානායක මාවත‘‘ යන නාමය භාවිතා කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉහත නම් සඳහන් මහතා විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම මාර්ගයට දිසානායක මාවත නමින් නම් කිරීම සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොමැති බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉහත සඳහන් කර ඇති අතුරු මාර්ගය සඳහා “දිසානායක මාවත‘‘ යන නාමය භාවිතා කර ප්‍රසිද්ධියට පත් කිරිම සුදුසු බව සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 09**

මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පහත නම් සඳහන් අය විසින් වැසිකිළි ආධාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. මෙම ඉල්ලුම්කරුවන් අඩු ආදායම්ලාභින් ලෙස අදාළ ග්‍රාම නිලධාරින් විසින් සහතික කර ඇත. ඒ අනුව මොනරාගල ප්‍රාදේශීය සභාව 2021 වර්ෂයේ අය වැය යෝජනා මගින් වැසිකිළි ආධාර සඳහා රු.1000000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින්, එම ප්‍රතිපාදන මගින් පහත සඳහන් අඩු ආදායම්ලාභින් සඳහා වැසිකිළි ආධාර ද්‍රව්‍ය ලබා දීමට මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | වසම | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ඉල්ලුම් කරන ද්‍රව්‍ය |
|---|---|---|---|
| 01 | හොරොම්බුව | බී.ඩබ්.නිශ්ශංක විජේකුමාර | ළිං වළලු 3, වැසිකිළි පෝච්චි 01, කම්බි 02 (මි.මි.10) |
| 02 | තෙනගල්ලන්ද | බී.එම්.සුසන්ත කුමාර | බ්ලොක් ගල් 80, සිමෙන්ති 02, කම්බි 02 (මි.මි.10) |
| 03 | තෙනගල්ලන්ද | පී.ජී.රම්‍යලතා බංඩාර | ළිං වළලු 3, සිමෙන්ති 03 |
| 04 | තෙනගල්ලන්ද | ඒ.ඩී.සුනේත්‍රා කුමාරි | ළිං වළලු 3, සිමෙන්ති 03 |
| 05 | තෙනගල්ලන්ද | එම්.ටී.නන්දාවතී | ළිං වළලු 3, බ්ලොක් ගල් 75 |
| 06 | තෙනගල්ලන්ද | ආර්.එම්.සුනේන්ද්‍රා රත්නායක | බ්ලොක් ගල් 80, සිමෙන්ති 08, කම්බි 02 (මි.මි.10) |
| 07 | තෙනගල්ලන්ද | ජී.ඩබ්.ජයසූරිය | බ්ලොක් ගල් 80, සිමෙන්ති 05, වැසිකිළි පෝච්චි 01 |

මෙහි අනු අංක 02 යටතේ තෙනගල්ලන්ද බී.එම්.සුසන්ත කුමාර මහතා සඳහා ලබා දෙන සිමෙන්ති මලු 2 ක ප්‍රමාණය මලු 7 ක් ලෙස නිවරදි විය යුතු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

එම නිවරදි කිරීමත් සමඟ මෙම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයට අය වැයෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි පහසුකම් වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර ලබා දීම සඳහා වෙන් කර ඇති රු.1,000,000.00 ක මුදලින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රමවත් වැසිකිළි පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීමට තෝරාගෙන ඇති පවුල් සඳහා ද මෙවර මහ සභාවට ඉදිරිපත් කර ඇති මෙම තොරතුරුවලට අදාලව එම පවුල් සඳහාද අදාල ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවත්, ඒ සඳහා අය වැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත් සභාවේ බහුතරයක් දෙනා විසින් අනුමත කර සිටින ලදි.

**යෝජනා අංක 10**

මොනරාගල නව බස් නැවතුම්පොළ ගුණසිරි හෝටලය අසල නව කඩ කාමර 04 ක් සභා අරමුදලින් ඉදිකිරීම සඳහා (දළ ඇස්තමේන්තුව රු.1050987.69) මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙය නගරයේ ගුණසිරි හෝටලය පිටුපස පවතින භාවිතයට නොගන්නා පැරණි වැසිකිළි පද්ධතිය මෙම ඇස්තමේන්තු යටතේ නැවත අලුත්වැඩියා කර කඩ කාමර 4 ක් වශයෙන් විධිමත්ව සකස් කර ටෙන්ඩර් මගින් බදු දීමට පියවර ගනිමු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඇස්තමේන්තු ප්‍රකාරව භාවිතයට නොගන්නා මෙම පැරණි වැසිකිළි පද්ධතිය නැවත අලුත්වැඩියා කර කඩ කාමර 4 ක් වශයෙන් සභා අරමුදල් යටතේ විධිමත්ව සකස් කර ටෙන්ඩර් මගින් බදු දීමට පියවර ගැනීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 11**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංක | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 01 | කර්මාන්ත අංශය සඳහා ලැප්ටොප් වර්ගයේ පරිගනකයක් ලබා ගැනීම | 120,000.00 |
| 02 | මාර්ග අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 97,990.00 |
| 03 | විදුලි බල්බ 200 ක් මිලදී ගැනීම | 138,000.00 |
| 04 | ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගෑස් සිලින්ඩර් නැවත පිරවීම | 140,600.00 |

එම යෝජනාව සුදුසු බවට වයි.ආර්.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම මිලදී ගැනීම් අත්‍යාවශ්‍ය බැවින්, අදාල උපකරණ හා භාණ්ඩ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිලදී ගැනීමටත්, ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවටත් ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 12**

මොනරාගල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ සියළුම ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරමින් ලියාපදිංචි වී ඇති පෙර පාසල්වල (පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල) ඉගෙනුම ලබන දරුවන්ගේ සෑම වර්ෂයකම වර්ෂ අවසාන විසිර යාමේ උත්සවයන් සඳහා ඒ ඒ ග්‍රාම නිලධාරී වසම් නියෝජනය කරන ප්‍රාදේශීය සභා සභිකවරුන්ට සහභාගී වීමට සිදු වේ. අදාළ ග්‍රාම සේවා වසම්වල පවත්වා ගෙන යනු ලබන ලියාපදිංචි පෙර පාසල්වල මෙසේ වර්ෂ අවසාන උත්සව සඳහා මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් සහයෝගය ලබාදීම වෙනුවෙන් මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයට අදාළව සකස් කරන ලද අය වැය ලේඛනයේ රු.500000/= ක ප්‍රතිපාදන වෙන් කර ඇත 2021.10.05 දින පැවති මුදල් කමිටු රැස්වීමේදී මෙම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡාවට බඳුන් කළ අතර, එහිදී මෙම ළමුන් සඳහා මෙම ප්‍රතිපාදන යටතේ එක් අයෙකු සඳහා රු. 660.50 ක මුදලක් වැය කර ත්‍යාග වශයෙන් වතුර බෝතලයක් සහ කෑම පෙට්ටියක් ලබා දීමට තීරණය කරන ලදී. එය පහත ලේඛනයේ සඳහන් කර ඇති පරිදි ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව

| අදාළ මන්ත්‍රීවරයාගේ නම | ග්‍රාම නිලධාරී වසම | පෙර පාසලේ නම | ළමුන් සංඛයාව |
|---|---|---|---|
| ගරු සභාපති, ආර්.එම්.රත්නවීර මැතිතුමා | විහාරමුල්ල | මොනරාගල ප්‍රාදේශීය සභා මුල් ළමාවිය මධ්‍යස්ථානය | 115 |
| ගරු උපසභාපති, ප්‍රදීප් විජේරත්න මැතිතුමා | මාරාව | සිහිනි මුල් ළමාවිය මධ්‍යස්ථානය | 18 |
| | කහම්බාන | සමගිතරු පෙර පාසල | 11 |
| | තෙනගල්ලන්ද | 1. ඉසුරු මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන | 27 |
| | | 2. කැකුළු මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය | 13 |
| | | 3. ධර්මවිජය මුල් ළමාවිය මධ්‍යස්ථානය | 22 |
| කේ.එම්.ගුණවර්ධන මැතිතුමා | වෙහෙරගල | පුබුදු මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය | 27 |
| | කොලොන්වින්න | සිදිනි මුල් ළමාවිය මධ්‍යස්ථානය | 20 |
| | කවුඩාව | නවෝදා මුල් ළමාවිය මධ්‍යස්ථානය | 15 |
| | බෝහිටිය | 1. සිත්රු පෙර පාසල | 06 |
| | | 2. පුබුදු පෙර පාසල | 25 |
| රංජිත් රත්නායක මැතිතුමා | හුලංදාව | 1. කිංස් පැරඩයිස් පෙරපාසල | 17 |
| | | 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාල පෙර පාසල | 55 |
| සුනිල් අරංගල මැතිතුමා | හොරොම්බුව | 1. දිලෙනතරු පෙර පාසල | 21 |
| | | 2. සිහිනි පෙර පාසල | 08 |
| | කුඹුක්කන | ලහිරු මුල් ළමාවිය මධ්‍යස්ථානය | 10 |
| ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා | රත්තනපිටිය | 1.විමුක්ති පෙර පාසල | 25 |
| | | 2.සිහිනි පෙර පාසල | 20 |

| | | | |
|---|---|---|---|
| චාමර නානායක්කාර මැතිතුමා | නක්කල | 1.සරණතිස්ස පෙර පාසල | 22 |
| | | 2. ජයබිම පෙර පාසල | 32 |
| | | 3.ලිට්ල් ස්ටාර් පෙර පාසල | 15 |
| | හිදිකිවුල | 1.භාරදී පෙර පාසල | 18 |
| | | 2.ඉන්ද්‍රාරාම පෙර පාසල | 10 |
| | ටැංවත්ත | 1.රෝස කැකුළු පෙර පාසල | 20 |
| | | 2.ප්‍රගති ප්‍රතිභා පෙර පාසල | 23 |
| සන්ධ්‍යා අනුරුද්ධිකා මැතිතුමිය | බටුගම්මන | 1.නෙළුම් පෙර පාසල | 10 |
| | දෙබැද්දේකිවුල | 1.දිමුතු පෙර පාසල | 16 |
| | ගුරුහෙල | 1.නවෝදයා පෙර පාසල | 12 |
| | | 2.සමගි ළදරු උයන | 11 |
| | | 3.පිපෙන කැකුළු පෙර පාසල | 16 |
| තමෝදිරම් ජයජීලන් මැතිතුමා | අලියාවත්ත | 1.මල්ලිහෙයි පෙර පාසල | 25 |
| | | 2.කුරුංජි පෙර පාසල | 35 |
| | වැලියාය | 1.ලක්ෂ්මී පෙර පාසල | 37 |

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී වයි.ආර්.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් තමන් නියෝජනය කරන හුලංදාව දකුණ සහ හුලංදාව වම ග්‍රාම නිලධාරී වසමට අයත් පෙර පාසල් ගණන සහ ළමුන් සංඛ්‍යාවද පහත සඳහන් පරිදි මෙම යෝජනාවටම ඇතුලත් කිරීමට මහ සභා අනුමැතිය ලබා දෙන ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

| අදාළ මන්ත්‍රීවරයාගේ නම | ග්‍රාම නිලධාරී වසම | පෙර පාසලේ නම | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| වයි.ආර්.උපුල් මැතිතුමා | හුලංදාව දකුණ | 01. එක්සත් ආදර්ශ පෙර පාසල | 32 |
| | | 02. ශක්ති පෙර පාසල | 22 |
| | හුලංදාව වම | 01. පුබුදු පෙර පාසල | 20 |
| | | 02. දිමුතු පෙර පාසල | 24 |

ඉන් පසු ගරු සභාපතිතුමන් ඉදිරිපත් කළ යෝජනාව සහ වයි.ආර්.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලිම සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල ප්‍රාදේශිය සභා බල සීමාව තුළ සියළුම කොට්ඨාශ නියෝජනය කරමින් පෙර පාසල්වල (පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල) ඉගෙනුම ලබන දරුවන්ගේ වර්ෂ අවසාන විසිර යාමේ උත්සවයන් සඳහා සහභාගී වන ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සභිකවරුන්ට අදාළ ග්‍රාම සේවා වසම්වල පවත්වා ගෙන යනු ලබන ඉහත සියලුම පෙර පාසල්වල වර්ෂ අවසාන විසිර යාමේ උත්සවයන් සඳහා සෑම ළමයෙකුටම ත්‍යාග වශයෙන් වතුර බෝතලයක් සහ කෑම පෙට්ටියක් ලබා දීම සුදුසු බවත් ඒ සඳහා අය වැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත් සභාව ඒකමතිකව අනුමත කර සිටින ලදි. එසේම විධිමත් පරිදි මිල ගණන් කැඳවා එක් ළමයෙකු සඳහා යන වියදම ද සහිතව මිළ කමිටු තීරණයන්ද සමඟම ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස සභාව තවදුරටත් තීරණය කර සිටින ලදි.

**යෝජනා අංක 13**

මොනරාගල, කුඹුක්කන, සුදුවතුර ආර, අංක 05 හි පදිංචි ඩී.එම්.ආරියදාස මහතා විසින් සුදුවතුර ආර ගල්ටැම්මණ්ඩිය ප්‍රධාන මාර්ගයේ සුදුවතුරආර ගොවි සංවිධානයට අයත් ගොඩනැගිල්ල අසලින් සම්බන්ධ වන අතුරු මාර්ගයේ ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ වන මාර්ග කොටස ඉතා අබලන්ව පවතින බැවින්, ගමනා ගමනයේදී මෙන්ම භාණ්ඩ ප්‍රවාහනයේදී මෙහි පවුල් 10 පමණ ජීවත් වන පිරිස දැඩි දුෂ්කරතාවයට පත්ව ඇති අතර, සිමෙන්ති ගල් අතුරා මීටර් 100 ක පමණ මෙම මාර්ග කොටස සකස් කර දෙන ලෙසට කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ මෙම අවශ්‍යතාවය අනුව නව මාර්ග ව්‍යාපෘති යටතේ කාපට් කිරීමට නියමිත මාර්ග වලින් ගලවා ඉවත් කරනු ලබන කුට්ටි ගල් අතුරා මෙම මාර්ගය සකස් කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 14**

මොනරාගල, සිරිවිජයපුර, අංක 88 හි පදිංචි එච්.ජී.විනීතා කල්‍යාණි මහත්මිය විසින් පැරණි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒවායින් ඉවත් කරන ලද පරණ සෙවිලි ෂීට් ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට උදේනි රම්‍යලතා ගරු මන්ත්‍රිතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ පැරණි ඉදිකිරීම් වලින් ඉවත් කරන භාවිතයට ගත හැකි සෙවිලි ෂීට් මෙම ඉල්ලීම් කර ඇති මහත්මියගේ අවශ්‍යතාවය අනුව ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 15**

මොනරාගල, දුටුගැමුණු මාවත, අංක 42/3 හි පදිංචි කේ.ඒ.රංජිත් මහතා විසින් පැරණි ඉදිකිරිම් ඉවත් කිරිමේදී ඉවත් කරන ලද පරණ සෙවිලි ෂීට් හා ලී දඬු ප්‍රමාණයක් ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ පැරණි ඉදිකිරීම් වලින් ඉවත් කරන භාවිතයට ගත හැකි සෙවිලි ෂීට් හා ලී දඬු මෙම ඉල්ලීම් කර ඇති මහතාගේ අවශ්‍යතාවය අනුව ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 5.10 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තමෝදිරම් ජයසීලන් මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල, මොනරකැලේවත්ත ඉහළ කොටසේ කුරුවිගල වත්තට යන මාර්ගයේ සභා රමුදලින් පාලමක් ඉදිකිරිම සඳහා සභා අනුමැතිය හා සභා තීරණය ලබා දීම සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමන් විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සහා ඇමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව ඒකඟතාවය එල කර සිටි බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

I. හුලංදාව ජාතික විගණන අධිකාරී උප උප කාර්යාලය අසල මාර්ගය මීට වසර 15කට පමණ පෙර තාර යොදා සකස් කර තිබුණද මේ වන විට ගමණා ගමණයටද ඉතා අපහසුතාවයන් ඇතිවන අයුරින් දැඩි ලෙස සෝදාපාලුවට ලක්ව ඇති මෙම මාර්ගය සකස් කර දෙන ලෙසට විගණන අධිකාරීතුමන් විසින් කරන ලද ඉල්ලීම 2021 අප්‍රේල් මාසයේදී සහා අනුමැතිය ලැබී තිබුනද මෙය ක්‍රියාත්මක නොකර මේ වන විට මාස 06 කාලයක් ඉක්ම ගොස් ඇති නිසාත්, රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසාත්, ප්‍රිමික්ස් , තාර මාර්ග සකස් කරන කොන්ත්‍රාත් කරුවෙකු ද සොයා ගැනීමට අපහසු වූ නිසාත් යන හේතු ගණනාවක් මත මෙම මාර්ගය සකස් කිරීමට නොහැකි වූ හෙයින් මේ වන විට මෙම මාර්ගය සකස් කිරීමට අවශ්‍ය සියලු පහසුකම් පවතින බැවින්, ඒ අනුව කාර්මික නිලධාරී මහතා විසින් නැවත සකස් කර ඉදිරිපත් කර ඇති රු.477,488.33ක ඇස්තමේන්තු මුදලට අනුව පවතින අධික වැසි සමය හේතුවෙන් මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති මෙම මාර්ගය ඉතා කඩිනමින් සකස් කිරීමට සිදුවන බැවින් විගණන අධිකාරීතුමන්ද නිතර නිතර විමසීම් කරන බැවින් අද දිනම මේ සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු අතර මේ සඳහා මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කරුණු කරනා සලකා බැලීමේදී මෙම හදිසි යෝජනාවේ කිසිම ගැටලු සහගත තත්ත්වයක් නොමැති අතර මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු ඇස්තමේන්තු ප්‍රකාරව හා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදල් යටතේ ඉතා කඩිනමින් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

II. ඒ වගේම පසු ගිය දිනවල පැවති අධික වර්ෂාවත් සමඟ ඉතාමත් අබලන් තත්ත්වයේ පැවති පොතුවිල් පාර දයාරත්න කුෂන් වැඩපල අසලින් පින්නගොල්ල පළමු අතුරු මාර්ගල දැඩි ලෙස බාදනයට පත්ව ඇති බැවින් ඉතා කඩිනමින් මෙහි මීටර් 35 ක පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් කර සකස් කර දෙන ලෙසට ප්‍රදේශවාසීන් විසින් කර ඇති ඉල්ලීම සඳහා කාර්මික නිලධාරී මහතා විසින්ද පරීක්ෂා කර බලා මෙය ප්‍රමාද නොකර ඉතාමත් කඩිනමින් සංවර්ධනය කළ යුතු බවට වාර්තාවක් ලබා දී ඇති බැවින් මෙම දිනවලම ඉතා කඩිනමින් මෙම මාර්ගය සකස් කිරීමට සිදුවන

බැවින් අද දිනම මේ සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු අතර මේ සඳහා මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කරුණු කරනා සලකා බැලීමේදී මෙම හදිසි යෝජනාවේ කිසිම ගැටලු සහගත තත්ත්වයක් නොමැති අතර විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු ඇස්තමේන්තු ප්‍රකාරව සහා අරමුදල් යටතේ ඉතා කඩිනමින් සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

III. ඒ වගේම 2022 වර්ෂයට සභාව සතු දේපල බදු දීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය පත් කර ගැනීම ලබන මහ සභාවේ න්‍යාය පත්‍රානුකූලව යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණද ඊයේ දිනයේදී ගත් හදිසි තීරණයක් මත ලබන සතිය වන විට ටෙන්ඩර් කමිටුව තෝරා පත් කර ගැනීමට අවශ්‍ය නිසා අද දිනම මේ සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු අතර මේ සඳහා මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

එහිදී වයි.ආර්. උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් 2022 වර්ෂයේ සභාවේ ටෙන්ඩර් කමිටුවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් සුදුසු බවට යෝජනා කර සිටින ලදි.
එම යෝජනාව කේ.එම්. ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදි.

අනතුරුව අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමන් විසින් 2022 වර්ෂයේ සභාවේ ටෙන්ඩර් කමිටුවට ප්‍රදීප් ධම්මික විතානගේ ගරු මන්ත්‍රීතුමන් සුදුසු බවට යෝජනා කර සිටින ලදි.
එම යෝජනාව රමණී රත්නායක ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදි.

අනතුරුව සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් 2022 වර්ෂයේ සභාවේ ටෙන්ඩර් කමිටුවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමාත් , පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත් සුදුසු බවට යෝජනා කර සිටින ලදි.
එම යෝජනාව සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදි.

2022 වර්ෂයේ සභාවේ ටෙන්ඩර් මණ්ඩලයට ඉහතින් යෝජනා කරන ලද සියලුම මන්ත්‍රිවරුන් ද ගරු සභාපතිතුමන් අතුළුව අදාල අනෙකුත් නිලධාරීන්ද යොදවා ගැනීම සුදුසු බවට සභා සම්මත විය.

IV.අනතුරුව සභාවෙන් අවසර ගෙන සිටි ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින්මොනරාගල බුක්කිරියගොල්ල ශ්‍රී සුධර්මානන්ද විහාරස්ථානාධිපතිව වැඩ වාසය කරන මොනරාගල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු සභාපතිධූරය දරන ශ්‍යාමෝපාලී වාංශික මහා නිකායේ මල්වතු පාර්ශවයේ මොනරාගල දිස්ත්‍රීක්කයේ ප්‍රධාන සංඝනායක අති ගෞරවණීය බදුල්ලගම්මන රතනසාර නාහිමිපාණන් වහන්සේ ප්‍රදේශයටත්,බෞද්ධාගමික අධ්‍යාපන හා ශාසනික වශයෙන් ඉමහත් සේවාවක් සිදු කරනු ලබන මෙම ගෞරවණීය නායක හිමිපාණන් වහන්සේගේ 85 වන ජන්ම දිනය 2021 ඔක්තෝබර් මස 25 වන දිනට යෙදී ඇති බැවින් මොනරාගල නගරයේ මොනරාගල මෝටර්ස් අසලින් ආරම්භව පැරණි පොළ භූමිය හරහා මොනරාගල කෙළින් වීදියට ප්‍රවේශ වන මාර්ගය “ශ්‍රී රතනසාර මාවත”නමින් නම් කර දීමට විහාරස්ථානයේ දායක සභාව විසින් කර ඇති ඉල්ලීම ගරු මන්ත්‍රීතුමන් විසින් සභාවට යෝජනා කර සිටින ලදි.
එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

එහිදී ජීවත්ව සිටින කෙනෙකුගේ නමින් මාර්ග නම් කිරීම නීතිමය වශයෙන් ප්‍රශ්නයක් ඇතිවීමට ඉඩ ඇති බවට ගරු සභාපතිතුමන් දන්වා සිටින ලදි.

එහිදී අදහස් දක්වා සිටි චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ජීවත්ව සිටින කෙනෙකුගේ නමින් මාර්ගයක් නම් කිරීම කිසිම ගැටලුසහගත තත්ත්වයක් ඇති නොවන අතර ප්‍රදේශයට විශාල සේවාවක් සිදුකර ඇති මෙම හිමිපාණන්ගේ නමින් මෙම මාර්ගය නම් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ප්‍රකාශ කර සිටින ලදි.

ඒ සම්බන්ධයෙන් කරුණු කාරණා සොයා බලා ඉදිරියේදී තීරණයක් ලබා දෙන්නම් බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

## 06.ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.09.01 දින සිට 2021.09.30 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කම්ටු වාර්තා සලකා බැලීම

නැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

## 8.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.උපුල් මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව අතිගරු ජනාධිපතිතුමන්ගේ හා අග්‍රාමාත්‍යතුමන්ගේ වැඩ පිළිවෙල අනුව සමස්ථ රටේ ප්‍රජාව කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා එන්නත්කරණ වැඩපිළිවෙල ඉතාමත් සාර්ථකව සිදු කර ගෙන ගිය අතර, මේ වන විට අවුරුදු 20 ට වැඩි සියළු දෙනාටත් එන්නත්කරණය සිදු කිරීමට පියවර ගෙන තිබෙන අතර, දෙවන එන්නත්කරණය සිදු කිරීමට පියවර ගෙන තිබෙන අතර, දෙවන මාත්‍රාව ලබාදුන් සියළු දෙනාට තෙවන මාත්‍රාව ලබා දීමේ සියළු වැඩ කටයුතු මේ වන විට සූදානම් කර ඇති බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා වසංගතය නිසා ගුරුවරුන්ට හා දරුවන්ට දීර්ඝ කාලයක් නිවසට වී සිටීමට සිදු වුව ද දෙවිවරුවන් වැනි ගුරුවරුන් Online හරහා රටේ අනාගත සම්පත වන දරුවන්ට අධ්‍යාපනය ලබා දුන් අතර, මේ වන විට අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ රජයේ මැදිහත් වීමෙන් පාසල් ආරම්භ කිරිමට ගෙන ඇති වැඩපිළිවෙල සඳහා අප සියළු දෙනා දරුවන් පාසල් වෙත යවමින් ඒ කටයුතු සාර්තක කර ගැනීමට උදව් විය යුතු වගේ ම පවතින වසංගතයත් සමග මුළු ලෝකෙම මෙන් ම රටේ සියළුම අංශ බිඳ වැටී ඇති මොහොතක ගුරුවරුන්ගේ වැඩ වර්ජනයට ද මේ වන විට රටේ නායකයින් විසින් විසඳුමක් වශයෙන් වර්ෂ දෙකක් ඇතුළත අවස්ථා දෙකක් යටතේ මුදල් වැඩි කර දීමට පොරොන්දු වී ඒ සඳහා හිස නමා ප්‍රතිචාර දක්වා ඇති බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, ගුරු අරගලය තාවකාලිකව නවතා බුද්ධිමත් දරු පිරිසක් අනාගතයට බිහි කිරීම වෙනුවෙන් ඇප කැප වෙන දෙවිවරුන්ට ශක්තිය ධෛර්ය ලැබිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම ඉදිරි වැසි සමයත් සමග තමන්ගේ කොට්ඨාසයේ අත්‍යාවශ්‍ය අතුරු මාර්ග කිහිපයක් කපා සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටිමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

### ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

- ළමයින් 200 ට අඩු ප්‍රමාණයක දරුවන් සිටින පාසල් ආරම්භ කිරිමට මේ වන විට පියවර ගෙන ඇති අතර, ඒ සියළු විදුහල්පතිවරුන්ට දැනුවත් කිරිමේ වැඩසටහනක් හෙට දිනයේ පැවැත්වීමට කටයුතු යොදා ඇති බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, පාසල් පටන් ගැනීමත් සමග ගුරු උද්ඝෝෂනය මත යම් දෙයක් සිදුවනවා ද යන්න අපි සියළු දෙනා ම අවධානයෙන් සිට සොයා බැලීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, ඒ වගේ ම ගුරුවරුන්ගේ අරගලයේදී බොහෝ ලෙස ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිතයන්ගෙන් විශාල වශයෙන් උදව් උපකාර ලබා ගෙන සිටි නිසා ඔවුන් විසින් ම මේ අරගලය සාර්ථකව නිම කර ගැනීම වෙනුවට නැති ප්‍රශ්න වැඩි කර ගත් බවට ගරු සභාපතිතුමන් ද ප්‍රකාශ කර සිටින ලදී.

## 8.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශිය සභා නියෝජනය කරන කොට්ඨාස භාර මන්ත්‍රීවරුන්ට පමණක් ලක්ෂ තිහක පමණ ප්‍රමාණයකට සංවර්ධන යෝජනා ලබා දීම සඳහා රජය විසින් පියවර ගෙන ඇති අතර, නමුත් ජනතා නියෝජිතයින් වශයෙන් පත්වී ඇති

මන්ත්‍රීවරුන් කොටසකට මෙම වරප්‍රසාද ලබා දීමත් කොටසකට ලබා නොදී සිටීමටත් කුමන හේතුවක් බලපා ඇත් ද යන්න ගැටලුවක් බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, පාර්ලිමේන්තුවේ 225 දෙනාටමත් ජාතික ලැයිස්තුවේන් ආ 29 දෙනාටමත්, ඇතුළුව පළාත් සභාවේ සියළුම දෙනාටත් මෙවැනි වරප්‍රසාද ලබා දෙන්නේ නම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දෙවිදිහකට වරප්‍රසාද ලබා දීම සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාටත්, අගමැතිතුමාටත් ජනාධිපතිතුමාටත් විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය දිනක තමන් දන්නා හඳුනන කෙනෙකු වීජීරේඛාවක් ලබා ගැනීම සඳහා සභාවට පැමිණි අවස්ථාවකදී සභාවේ නිලධාරි මහතෙකු විසින් ඔහුත් සමඟ ඇති යම් පුද්ගලික හේතුවක් පදනම් කර ගෙන එය ලබා දීමට නොහැකි බවට ප්‍රකාශ කර ඇති අතර, මෙවැනි දේවල් තව කොතෙකුත් වෙනවා ඇත් ද කියා වැටහෙන බවත්, නමුත් මේ සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කිරිම සම්බන්ධව ලේකම්තුමාටත් ගරු සභාපතිතුමාටත් ස්තුතිය පුද කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, මෙවැනි දේවල් ඉදිරියේදී සිදු නොවීමට ලේකම්තුමාත්, ගරු සභාපතිතුමාත් වග බලා ගත යුතු අතර පෞද්ගලික ප්‍රශ්න වෙන ම විසදා ගත යුතු අතර, පක්ෂ භේදයකින් තොරව බල ප්‍රදේශයේ සියළුම ජනතාවට සේවා සැපයීම මෙම ආයතනයේ වගකීමක් වන බව ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම කොරෝනා උවදුරින් ජනතාව බේරා ගැනීමට රටේ නායකයින් කළ කටයුතු සම්බන්ධයෙන් වයි.උපුල් මන්ත්‍රීතුමා යම් යම් ප්‍රකාශ සිදු කළත් විද්‍යාත්මකව සිතා බලා රටේ බලධාරින් තීන්දු තීරණ ගත්තා නම් මේ නිසා මරණයට පත් වූ සියළු දෙනාගේ ද ජීවිත බේරා ගැනීමට හැකිව තිබූ බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේ ම මේ දිනවල ගෑස් ප්‍රශ්නය ඇතුළුව විවිධ ප්‍රශ්න රාශියක් හේතුකොට ගෙන විරෝධතා උද්ඝෝෂණ නොයෙක් ස්ථානවල පවතින අතර, ගුරුවරුන්ගේ අරගලයට හේතුව අඩු තක්සේරුවකින් බැලිම හොඳ නැති බවත්, මෙහිදී වගකිවයුතු සියළුම බලධාරින් සාකච්ඡා කර නිවැරදිව හා බුද්ධිමත්ව කටයුතුකළා නම් මේ ප්‍රශ්න දුර දිග නොයවා විසදා ගැනීමට තිබුණු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. මොනදේ වුවත් වැරදි දේවල් වැරදි ආකාරයෙන් දැකිය යුතු අතර, විවේචනය කළ යුතු දේවල් අදාළ තැන්වලදී විවේචනය කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, පක්ෂ පාට භේදයකින් තොරව අපි සියළු දෙනාම එකසේ කටයුතු කරමු යන්න ප්‍රකාශ කරමින් සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- කොට්ඨාසවල සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දීමේදී කිසිම පක්ෂ පාට භේදයකින් තොරව ලබා දීමට රජය කටයුතු කර ඇති අතර, මොනරාගල බල ප්‍රදේශයේ කොට්ඨාස 10 ම නියෝජනය කරන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අතර, එහි කිසිම ගැටළුවක් නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී. ඒ වගේම වීජීරේඛා ප්‍රශ්නයේදී ඔහුගේ නිවාස සැලැස්මෙහි පැවති අඩු පාඩුවක් මත අදාල නිලධාරියා එසේ ප්‍රකාශ කර ඇති අතර පසුව එය විසඳා දුන් බවද ප්‍රකාශ කර සිටින ලදී.
- ඒ වගේ ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමයේදී පැවති සෑම උද්ඝෝෂණයකදී ම වතුර ප්‍රහාර, කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කර ඒවා මර්ධනය කළ ද මේ ආණ්ඩුව යටතේ එසේ සිදු නොකිරීම මත ගුරු අරගලය දිගින් දිගට ම පැවතිය අතර, කෙසේ වෙතත් රටේ පවතින තත්ත්වයත් සමඟ ගුරුවරුන් මෙසේ හැසිරීම සම්බන්දයෙන් කණගාටුවන බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදී.

## 8.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව නව දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල අසල ඇති සභාවට අයත් ශරීර සුවතා ස්ථානයට මේ වන විට විශාල වශයෙන් රජයේ සේවකයින් උසස් නිලධාරින් ශරීර සුවතා සඳහා පැමිණෙන අතර, මෙහි පවතින අඩු පාඩු වෙනුවෙන් ඔවුන් සභාවට දෝෂාරෝපණය කරන බවට ආරංචි පවතින අතර, විශේෂයෙන්ම සභාවේ යෝජනා කර ගත් පරිදි මෙහි ඇවිදින මං තීරුවල කුට්ටිගල් අල්ලා සකස් කර අදාළ විදුලි ලාම්පු ටික සම්පූර්ණ කර දෙන ලෙසට ගරු මන්ත්‍රිතුමා ඉල්ලා සිටින ලදී.

II. ඒ වගේ ම මොනරාගල නගරයේ පුද්ගලිකව ව්‍යාපාර කර ගෙන යන අයට වඩා බහුතරයක් සිටින්නේ කුළියට ගත් ස්ථානවල ව්‍යාපාර කටයුතු කර ගෙන යන අය බැවින් විශේෂයෙන්ම පළතුරු වෙළඳාම් කරන වෙළඳුන් ඇතුළුව මේ බොහෝ දෙනෙක් මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගෙන මේ ව්‍යාපාර කර ගෙන යන අතර, රටේ පැවති කොරෝනා වසංගතය හමුවේ මාස දෙක තුනක මොවුන්ගේ ණය වාරික ඇරියස් වී ඉතා අපහසුතාවයන්ට හා ආර්ථික ප්‍රශ්න රාශියකට මුහුණ දී සිටින පළතුරු වෙළඳසැල් හිමියන් ඇතුළු මේ පිරිස වෙනුවෙන් අනෙකුත් බදු කරුවන්ට මෙන් සභාව මගින් විකල්ප ස්ථාන ලබා දී යම් සාධාරණයක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින්, ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ගුරුවරුන්ගේ අරගලයේදී ඔවුන්ගේ ඉල්ලීම අසාධාරණ යැයි මේ වන විට රටේ කිසිම නායකයෙකු, බලධාරියෙකු විසින් විවේචනය කර නොමැති අතර, නමුත් රටේ පවතින තත්ත්වය හමුවේ ගුරුවරුන් ඉල්ලන වැටුප් තලය පිහිටුවීමට තරම් මුදලක් රජයට නොමැති අතර මේ වන විටද රටේ ජාතික ආදායමෙන් 80%ක් පමණ රජයේ සේවකයින්ට වැටුප් ගෙවන බැවින් මේ මොහොතේ ගුරුවරුන්ගේ වැටුප් වැඩිකිරීමක් සිදුවුවහොත් සමස්ථ රාජ්‍ය සේවකයින් අදාල වෘත්තීය සමිති හරහා නැගී සිටින අතර රටේ විශාල ගැටලුකාරී තත්ත්වයන් මතු වන බවත්, මේ මොහොතේ ගුරුවරුන්ගේ වගකීම විය යුත්තේ අහිංසක දරුවන්ගේ කඩා වැටී ගිය අධ්‍යාපණය යලි නගා සිටුවීම බැවින් හෙට දිනයේදීම දෙමාපියන්, ගරු විදුහල්පතිවරුන් මුණ ගැසී ඉතා වගකීමෙන් යුතුව සියලුදෙනාම එකතු වී මේ සඳහා විසඳුමක් ගැනීමට යම් වැඩපිළිවෙක් ආරම්භ කළ යුතු බවට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කරමින් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- ශරීර සුවතා ස්ථානයේ පවතින අඩු පාඩු ඉදිරියේදී සම්පූර්ණ කිරීමට පියවර ගන්නා බවත්,ඒ වගේම නගරයේ පළතුරු කඩ සියල්ලම පසු ගිය ආණ්ඩුව සමයේදී ලොතරැයි අලෙවි කිරීම සඳහා ලබා දී ඇති වෙළඳසැල් වන අතර නව මාකට් ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සභාවේ තීරණයක් මත මෙසේ තාවකාලිකව ලබා දී වෙළඳසැල් ඉවත් කිරීමට සිදු වූ අතර කෙසේ වෙතත් ඉදිරියේදී නගර අලංකරණ කටයුතු වලදී මේ සියලු තාවකාලික වෙළඳසැල් සියල්ලම ඉවත් කිරීමට සිදුවන බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදී.

## 8.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ආණ්ඩුවට මෙන්ම බල ප්‍රදේශයේ බොහෝ කටයුතු අකර්මණ්‍ය කරවන විවිධ මඩ ප්‍රහාර එල්ල කරමින් මේ වන විට සමාජ මාධ්‍ය ජාලා

හරහා දැවැන්ත ලෙස හානියක් කරගෙන යන මාධ්‍යවේදීන් කිහිපදෙනෙකු සිටින අතර විශේෂයෙන්ම ප්‍රදේශයේ පානීය ජලය,විදුලිය සම්බන්ධයෙන් මේ දින වල මඩ ප්‍රචාර පතුරුවන අතර වගකිව යුතු වැදගත් මාධ්‍යවේදියෙකු නම් යම් දෙයක් මාධ්‍යට හෙලි කිරීමට ප්‍රථම ඒ සඳහා වග කිව යුතු නිලධාරීන් හමු වී නිවරදි භාවය තහවුරු කර ගැනීමක් සිදු කළ යුතු වුවද එසේ නොකර වැරදි තොරතුරු මාධ්‍යට නිකුත් කරන මෙම මාධ්‍යවේදීන් සම්බන්ධව තීරණයක් ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම විවිධ ආණ්ඩු යටතේ දීර්ඝ කාලයක සිට පවතින මෙම ගුරුවරුන්ගේ ප්‍රශ්නය රටේ පවතින වර්තමාන තත්ත්වයත් සමඟ දැවැන්ත ලෙස මෙය අරගලයක් බවට පත් කරවීමට මෙය පිටුපසද කුමන්ත්‍රණකාරීන් සිටින අතර ලබන සතිය තුළ ආරම්භ වීමට නියමිත පාසල් වලට පැමිණෙන ගුරුවරුන් ආරක්ෂා කිරීම අපගේ යුතුකමක් හා වගකීමක් වන අතර මෙම ගුරු නාමය කෙලෙසෙන්නට ඉඩ නොදී රටේ අනාගතය භාර ගන්නට සිටින දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නගා සිටුවීමට සියලු දෙමාපියන් සමඟ එක් වී සාර්ථක වැඩපිළිවෙලක් ආරම්භ කළ යුතු බවත්, එසේම මෙසේ ආරම්භ වන සියලූ පාසල් පද්ධතියට ප්‍රාදේශීය සභාව මගින් ඉටු විය යුතු සියලු යුතුකම් නොපිරිහෙලා ඉටු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා දන්වා සිටින ලදී.

III. ඒ වගේම රටේ බඩු මිල සම්බන්ධයෙන් යම් යම් ප්‍රකාශයන් කර කර ඉන්නවාට වඩා මේ වසංගතයක් හේතුවෙන් රටට ලෝකයට සිදුව ඇති මහා ව්‍යසනය නිසා රටේ සියළුම අංශ කඩා වැටී ඇති මොහොතක රටේ ජනතාව වශයෙන් අපි සියලු දෙනාටම යම් යම් කැපකිරීම් කිරීමට සිදුවන අතර මෙය අරගල කරමින් රටේ ප්‍රශ්න තව තවත් වැඩිකරන මොහොතක් නොවන අතර රටක් ජාතියක් වශයෙන් මේ සියල්ල අප විසින් අවබෝධ කර ගෙන පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාම එකාවගේ නැගී සිටිමින් රට ගොඩ නගා ගැනීමට සහයෝගය ලබා දෙමු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමන් සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- බල ප්‍රදේශයේ බොහෝ කටයුතු සඳහා මඩ ප්‍රහාර එල්ල කරමින් විවිධ සමාජ මාධ්‍ය ජාලාවලට යොමු කරන මාධ්‍යවේදියෙකු සිටින අතර, මෙවැනි අය සිටින තාක් කල් අදාළ මාධ්‍යන්ට පවා කැළලක් ඇති වන බවත්, නිවැරදිව රාජකාරි කටයුතු සිදු කරන මාධ්‍ය වේදී මහතුන්ට මේ අයගේ අඩු පාඩු සොයා හෙළි කිරීමට හැකියාවක් තිබිය යුතු බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී වෙනත් කරුණු කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ සියලු දෙනාගේම එකඟතාවය මත සභාවේ කටයුතු අවසන් කරන ලදි.

- ලබන මස සභා රැස්වීම 2021 නොවැම්බර් මස 12 වන දිනට යොදා ගනිමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, ඒ සඳහා සභාවේ සියළු දෙනාම එකඟතාවය එල කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා</u>**

සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.00 ට පමණ අවසන් කරන ලදී.

2021.10.15 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ.............................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ............................................................................ වන දින පැවැති මහ සභාවේ.............................................................................................................යෝජනාවෙන් සහ.....................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරීමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරිම් නතර කිරිමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථීර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරිමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනාව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරිමේදි රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.